# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014

## 2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්

## සමාජීයවිද්‍යා පීඨය

## සංවර්ධන අධ්‍යයනය

## සංවර්ධිත හා සංවර්ධනයවන රටවල් DVST E - 1025

ප්‍රශ්න පහකට ( 05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය තුනයි (03)

---

1. (අ) 'සංවර්ධන සංකල්පය' පැහැදිලි කරන්න. (ලකුණු 04)

   (ආ) එම සංකල්පය පිළිබඳව මෑතකාලීනව ඉදිරිපත්ව ඇති මතවාද කෙටියෙන් පරීක්ෂා කරන්න. (ලකුණු 06)

   (ඇ) සංවර්ධන ක්‍රියාවලියේදී තිරසර සංවර්ධන උපායමාර්ග වල අවශ්‍යතාව උචිත උදාහරණ සහිතව ගෙනහැර දක්වන්න. (ලකුණු 10)

2. පහත සඳහන් සංවර්ධනය වෙමින් පවතින රටවල් බාණ්ඩ පිළිබඳ කෙටි පැහැදිලි කිරීම් ඉදිරිපත් කරන්න.
   a. ඛණිජ තෙල් අපනයනය කරන රටවල්
   b. ඉතා අඩු ආර්ථික සංවර්ධනයක් සහිත රටවල්
   c. අධික ණයගැතිභාවයක් සහිත රටවල්
   d. සංවර්ධනය වෙමින් පවතින දූපත් රාජ්‍ය
   e. සංවර්ධනය වෙමින් පවතින භූමියෙන් ආවරණය වූ රාජ්‍යයන්

   (ලකුණු 4x5)

3. සංවර්ධිත හා සංවර්ධනය වන රටවල් වෙන් වශයෙන් හඳුනාගතහැකි ආර්ථික නිර්ණායක පැහැදිලි කරන්න. (ලකුණු 20)

4. සංවර්ධනයවන රටවල් නව කාර්මික රාජ්‍යයන් වලින් වෙනස්වන්නේ කෙසේද යන්න පරීක්ෂා කරන්න. (ලකුණු 20)

5. හර - පර්යන්ත ප්‍රදේශ නිර්මාණය වීම රටක්තුළ සංවර්ධනයේ අවකාශීය අසමානතා ඇතිවීම කෙරෙහි බලපාන ආකාරය විවිධ මතවාද උපයෝගීකර ගනිමින් පරීක්ෂා කරන්න. (ලකුණු 20)

6. සංවර්ධිත හා සංවර්ධනයවන රටවල ජනසංඛ්‍යා ගැටලු සහ අභියෝග සන්සන්දනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

7. සංවර්ධනයවන රටවල සංවර්ධන පසුගාමීත්වය කෙරෙහි ප්‍රබලවම බලපාන ලද්දේ 'යටත්විජිතවාදයයි'. උචිත භූගෝලීය කලාපයක් තෝරාගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

8. සංවර්ධනයවන රටවල දරිද්‍රතාවයේ විශේෂ ලක්ෂණ පැහැදිලි කර ඒවයේ අවකාශීය විෂමතා ගෙනහැර දක්වන්න. (ලකුණු 20)

**********************